# ක්‍රි.පූ. 5-3 සියවස්හි ග්‍රීක හා රෝම විශ්‍රාන්තිමය අවස්ථා

ආර්.පී දුශ්ෂන්ත දීපාල් රාජපක්ෂ

පැරණි ග්‍රීසියේ හා රෝමයේ පද්‍ය සාහිත්‍යයෙහි සමෘද්ධිය හා විවිධත්වය පිළිබඳ ව සිංහල පාඨකයා හට කිසියම් හැඟීමක් දැනවීමේ අරමුණින් ග්‍රීක හා රෝම ගත්කරුවන්ගේ ලේඛන දහ අටක්, මහාචාර්ය මර්ලින් පීරිස් අතින් තෝරාගැණුනු අතර එම ලේඛන ඩී.ආර්.පොන්නම්පෙරුම මහතා අතින් සිංහලයට පරිවර්තනය වූයේ ග්‍රීක හා රෝම ලේඛන නම් වූ ග්‍රන්ථය ද සම්පාදනය කෙරෙමිනි. විශේෂයෙන්ම මෙම ලේඛන ග්‍රීක හා රෝම ශිෂ්ඨාචාරයන්ගේ ක්‍රි.පූ පස්වන සහ ක්‍රි.ව තුන්වන කාලසීමාව අතර වන නිසා මෙම අතීත ග්‍රීක හා රෝම අවධීන්හි පැවැතුණු ක්‍රීඩා හා විශ්‍රාන්තිමය චර්යයා පිළිබඳව මෙහිදී හෙළිවීම ලඝුකොට තැකිය නොහැකිය.

"විවේක දිනයන්හි ගත කරන ලද්දේ දඩයමේ යෙදීමෙනි..සෑම දෙනෙක්ම ව්‍යාඝ්‍රයින් හා අලි ඇතුන් දඩයම් කිරීම වඩාත් ම ජනප්‍රිය ක්‍රීඩාව ලෙස සැලකූහ..ගොවිතැන් කිරීම මහත් උද්යෝගයෙන් කළ නමුදු මිදි වැල් වලින් ප්‍රයෝජනයක් නොගැණින; පලතුරු වර්ග බහුලව තිබුණූ අතර ඔවුහු මසුන් මැරීමටත් විශේෂයෙන් ඉබ්බන් දඩයමට ආශා කළෝය...මම තරුණයෙකු ව සිටි කාලයේ දී ඔලිම්පික් ක්‍රීඩා බැලීම සඳහා මයිලේටස් නගරයෙන් පිටත් වුණෙමි..මුළු තේසාලිය පුරාම ඇවිදීමෙන් පසුව මේ සුප්‍රසිද්ධ පළාතට අයිති අවශේෂ ප්‍රදේශද බැලීමේ අශාවෙන් පෙළුණු මම අශුභ මොහොතක ලැරිස්සාවට ළඟාවීමි..තෙලිෆුන් තම කථාව නිම කළ සැනින් යළිත් මධු විතෙන් සන්තර්පණය වුණු ඔහුගේ සලෙලු සගයෝ නව ප්‍රබෝධයකින් ශබ්ද නගා සිනාසෙන්නට වූහ..එළිමහන් අව්වේ සිට ඉන් නොබෝ වේලාවකින් සිසිල් ජලය ස්නානය කොට මදක් හාන්සි වී දිවා අහාරය දමාගෙන අවසන් වී ඔහු (එවේලේ) සිටයේ සිය පොත් පත් බලමිනි..මවගෙන් පාවහන් ඉල්ලාගත් ඔහු එම අපූර්ව සිද්ධිය තමන්ට හොඳින් දැකබලා ගැනීමට හැකි ස්ථානයකට නැග ගත්තේය..ස්නානයෙන් පසුව හෙතෙම හාන්සි වී හිඳ රාත්‍රී භෝජනය අනුභව කළේය..ඔහු සිටයේ ඉතා උද්යෝගීමත් ස්වභාවයකිනි..එතැන ඔහු තමා වෙනුවෙන්ම අතුරන ලද ඇතිරිල්ලක හාන්සිවී හිඳිමින් කීපවරක්ම පානය කිරීම සඳහා ඇල් වතුර ඉල්ලුවේය..සියලු වයස්වල ජනයා විශේෂයෙන්ම ක්‍රීඩාවන්හි යෙදීමට තමන්ට ඇති අවකාශයෙන් පොළඹවනු ලබන ළමෝ මාළුබෑම, ඔරු පැදීම හා පිහිනීම වැනි විනෝදාංශවල යෙදීමෙන් ප්‍රීති වීම සඳහා මෙහි ගැවසෙති..මුහුදේ දියඹට පිහිනා යෑම නිර්භීත ක්‍රියාවක් ලෙස ඔවුන් විසින් සලකනු ලබන අතර එහි දී ජයග්‍රාහකයා වනුයේ මුහුදු වෙරළ සහ තරග වදින සෙසු මිතුරු පිහිනුම් කරුවන් පසුකොට වඩාත්ම දුරකට පිහිනන තැනත්තාය..වඩා එඩිතර බවක් දැක්වූ ළමයෙක් සෙසු අයට වඩා ජලයේ බොහෝ ඈතය ගියේය..ඔහුට මුණ ගැසුණු ඩොල්ෆීනයෙක් පිහිනන්නට පටන් ගත්තේ වරෙක ඔහු ඉදිරියෙන්, වරෙක ඔහු පිටුපසින් ද, නැවත ඔහු වටේ ද ගොස් අවසානයේ දී දිය යටින් කිමිද ඔහු තම පිට උඩ නංවාගෙන, නැවත ඉවතට දමා ආපසු පිට උඩට ගෙන..එබැවින් ඔවුහු ඌ ළඟට ගොස් ඌ සමඟ සෙල්ලම් කරන්නටත්, ඌ කැඳවමින් කථා කරන්නටත්, ඌ තමන් වෙත පැමිණි විට ඌ ස්පර්ශ කිරීමටත් පිරි මදින්නටත් පටන් ගත්හ..පළමුවෙන් ම ඌ දැන හැඳින ගත් ළමයා ඌ අසල ජලයේ සිටින විට පිහිනා ගොස් උගේ පිට උඩට පැන නැගගත් විට ඌ ළමයා රැගෙන දියඹට පිහිනා ගොස් උගේ පිට උඩට පැන නැගගත් විට ඌ ද ළමයා රැගෙන දියඹට පිහිනා ගොස් නැවත ආපසු ගොඩබිමට හැරලීය..අපගේ විවේක කාලය මට ඉගෙන ගැනීමටත් ඔබට ඉගැන්වීමටත් අවස්ථාව ලබාදෙයි..අපි අනික් යාත්‍රාවට මාරු වූ පසු අපි බීමට පටන් ගතිමු..ඔහු වූ කලී ක්‍රීඩා උත්සව වල නිතරම ඇලී ගැලී සිටි අනිකුත් අයට වඩා නින්දිත පුද්ගලයෙක් විය..ස්ත්‍රීන් විසින් සුරතලුන් ලෙස ඇතිකරන් ලබන, ඔවුන්ගේ දරුවන් සමඟ පවා හදා ගන්නා විශාල නාගයින් කිහිප දෙනෙකු ඔවුහු ..මෙතැන් සිට ඔවුහු රතු මුහුද තෙක් විහිදෙන කෝකසස් කඳුවැටිය හරහා ගමන් කළහ..එහිදී ලැබෙන මිදි වලින් නිෂ්පාදනය කරනු ලබන මධුපානය ඉස්තරම් වර්ගය වශයෙන් සැළකෙන අතර සුවද අතිමනරම්ය..දෙළුම් මෙන් ගෙඩි ඇති ගෙඩිය මැද බිලූ බෙල් මල මෙන් නිල් පැහැය ඇති එහි සාරවත් ලෙස වැවෙන අනිකුත් පලතුරු වලට වඩා මිහිරි රසයෙන් යුතු පළතුරක් වැවෙන ගස් ද ඔවුන්ට දක්නට ලැබිණ..කන්දෙන් පහළට බසින්නට වූ විට ඔවුහු නයි දඩයමක් දුටූහ.."

මහාචාර්ය මර්ලින් පීරිස් : ග්‍රීක හා රොම ලේඛණ : 2001 වර්ෂය : චතුර මුද්‍රණ ශිල්පියෝ, අවිස්සාවෙල්ල පාර, වැල්ලම්පිටිය : ISBN 955-20-4654-8